දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) 2013 පරීක්ෂණය - 2015 මැයි/ජූනි
First Examination in Arts (External) 2013 – May/June 2015

සවිප්‍ර 1.1 - සමාජ විද්‍යාවේ හා මානව විද්‍යාවේ මූලධර්ම
SGY 1.1 – Principles of Sociology and Anthropology

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න
අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු වීමට ඉඩ ඇත.

---

01. අනෙකුත් සමාජීය විද්‍යාවන්ට සාපේක්ෂව සමාජ විද්‍යාව ඉතා ලාබාල විෂයක් ලෙස බිහිවීමට බලපෑ හේතු මොනවාද යන්න පරීක්ෂා කරන්න.

02. "සංස්කෘතියකින් තොර සමාජයක් හෝ සමාජයකින් තොර සංස්කෘතියක් හෝ පිළිබඳව කථාකළ නොහැකිය" මේ සම්බන්ධයෙන් ඔබගේ අදහස් දක්වන්න.

03. "විවාහය සර්වකාලීනව හා නොනැසී පවතින සමාජ සංස්ථාවක් බවට පත්ව ඇත්තේ ඉන් සමාජයට සිදුවන වැදගත් කාර්යභාරය නිසාය." පරීක්ෂා කරන්න.

04. ජී.පී. මර්ඩොක් සහ ටැල්කොට් පාසන්ස් යන දෙදෙනා විසින් පවුල් සංස්ථාවෙහි කාර්යභාරය පිළිබඳව දක්වූ අදහස් සංසන්දනාත්මකව සාකච්ඡා කරන්න.

05. අපරාධ අපගාමී චර්යාවක් ලෙස තෝරාගනිමින් ඒවා ඇතිවීමට බලපාන හේතු පිළිබඳව කෘත්‍යවාදී, ගැටුම්වාදී හෝ අන්තර් ක්‍රියාවාදී යන මින් එක් න්‍යායාත්මක ප්‍රවේශයක් ඇසුරින් සාකච්ඡා කරන්න.

06. "තත්වය හා කාර්‍ය කොටස අතර ඇත්තේ අනුයෝජනීය සම්බන්ධතාවයකි." විමසන්න.

07. "ස්වභාවික සත්වයෙකු වශයෙන් උපත ලද මානව දරුවා සමාජීය සත්වයෙකු බවට පත් කිරීමේ ක්‍රියාවලිය සමාජානුයෝජනය නම් වේ." විභාග කරන්න.

08. පහත දක්වෙන ඕනෑම මාතෘකාවන් දෙකක් (02 ක්) පිළිබඳව සටහන් ලියන්න.
   i. රැල්ෆ් ලින්ටන්
   ii. ආගමෙහි සමාජ කාර්යය
   iii. භෞතික නොවන සංස්කෘතිය
   iv. සමාජ අන්තර් ක්‍රියාව

❀❀❀❀❀❀❀❀❀❀❀❀❀❀❀❀❀❀❀❀❀❀❀❀❀❀❀❀❀❀❀❀